සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017

# Second Term Test - Grade 8 - 2017

නම : ................................................ ක්‍රිස්තු ධර්මය කාලය : පැය 02 යි.

## I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) මැවීමේ කතාව සඳහන්ව ඇත්තේ ,
(i) උත්පත්ති පොතේ ය. (ii) නික්මයාම පොතේ ය.
(iii) ගීතාවලිය පොතේ ය. (iv) හිතෝපදේශ පොතේ ය.

(2) දේව මැවිල්ලේ අයිතිකරු,
(i) මිනිසා ය. (ii) දෙවියන්වහන්සේ ය. (iii) සාතන් ය. (iv) ආදම් ය.

(3) ඊශ්‍රායෙල් ජනතාව වහල් කමින් මුදවාගෙන ආවේ,
(i) ආබ්‍රහම් තුමා ය. (ii) මෝසෙස් තුමා ය.
(iii) ජොසෙප් තුමා ය. (iv) ජාකොබ් තුමා ය.

(4) නිරවුල් මනසක් පවත්වා ගැනිමට කිතුනු දරුවා,
(i) හොඳින් නිදා ගත යුතුය. (ii) ව්‍යායාම්වල යෙදිය යුතුය.
(iii) දෙමව්පියන්ට කීකරු විය යුතුය. (iv) නිරතුරු යාච්ඤා කළ යුතුය.

(5) ජේසුස් වහන්සේ ආබ්‍රහම්ගේ පුත්‍රයෙකු ලෙස හැඳින්වූයේ,
(i) පේදුරු ය. (ii) ජොහාන් ය. (iii) සාකෙවුස් ය. (iv) ලෙවී ය.

(6) කුරුණෑගල දියොකිසියේ තුන්වන බිෂොප් ධූරය දැරුවේ
(i) මර්සලින් ජයකොඩි පියතුමා ය. (ii) සෝමසිරි කුමාරදාස් පියතුමා ය.
(iii) ඇන්ඩෘ කුමාරගේ පියතුමා ය. (iv) කනගරත්නම් පියතුමා ය.

(7) බදු පොලේදී කැඳවාගත් ශ්‍රාවකයා වන්නේ ,
(i) මතෙව් ය. (ii) ජොහාන් ය. (iii) තෝමස් ය. (iv) ජුදාස් ය.

(8) ශ්‍රාවකයින්ට සුව කිරීමට නොහැකිව නැවත ජේසු තුමා වෙත ගෙන ආවේ,
(i) ලාදුරු රෝගියා ය. (ii) මීමැස්මොර රෝගියා ය.
(iii) උණ රෝගියා ය . (iv) අංශභාග රෝගියා ය.

(9) ජේසුස් වහන්සේ මැරුණු යෞවනයා උත්ථාන කිරීමෙන් සැනසීම ලබා දුන්නේ,
(i) මාර්තාට ය. (ii) මහලේ රෝගී ස්ත්‍රියට ය.
(iii) මග්දලායේ මරියාට ය. (iv) කායින් නුවර වැන්දඹුවට ය.

(10) යාච්ඤාවේ ගුරුවරිය ලෙස විරුදාවළිය ලැබුවේ,
(i) ඉව්ලින්කානි තුමියයි. (ii) තෙරේසා මව්තුමියයි.
(iii) එලීසා ඇග්නිව් තුමියයි. (iv) ජොයිස් ද සිල්වා තුමියයි.

(11) ජේසුතුමාගේ මෙහෙවරට අදාළ අරමුණු ඇතුළත් වන්නේ ,
(i) ගලිලයේ දේශනාවේ ය. (ii) නාසරෙත්හි දේශනාවේ ය.
(iii) ජෙරුසලමේ දේශනාවේ ය. (iv) එපීසියේ දේශනාවේ ය.

(12) ප්‍රථමයෙන්ම ධර්මදූත මෙහෙවර යොමු කරනු ලැබුයේ,
(i) සමාරිතයන්ට ය. (ii) විජාතිකයන්ට ය.
(iii) පව්කරුවන්ට ය. (iv) ඊශ්‍රායෙල් වංශයට ය.

(13) ඉව්ලින් කානි තුමිය උපත ලැබුවේ,
(i) එංගලන්තයේදී ය. (ii) ඉන්දියාවේදී ය.
(iii) ශ්‍රී ලංකාවේදී ය. (iv) ඇමරිකාවේදී ය.

(14) ජේසුස් වහන්සේට සාකෙවුස්ව මුණ ගැසුණේ,
(i) ගලීලයට යන අතරදී ය. (ii) බෙනානියට යන අතරදී ය.
(iii) ජෙරිකෝවට යන අතරදී ය. (iv) ජෙරුසලමට යන අතරදී ය.

(15) අධ්‍යාත්මික ලෙස කිතුනු දිවිය රස ගන්වන ඵල,
(i) 03 කි. (ii) 06 කි. (iii) 09 කි. (iv) 12 කි.

(16) තවත් පව් නොකරන්න. මෙලෙස ජේසුතුමා පැවසුවේ,
(i) පව්කාර ස්ත්‍රියට ය. (ii) ලාදුරු රෝගියාට ය.
(iii) සමාරි ස්ත්‍රියට ය. (iv) අන්ධ බාර්තමේයන්ට ය.

(17) ජේසුතුමා තෝරා ගත් ගෝලයින් 12 දෙනා හැඳින්වූ විශේෂ නාමය කුමක්ද ?
(i) දිවැසිවරුන් (ii) උපස්ථායකයින් (iii) ප්‍රේරිතයන් (iv) වැඩිමහල්ලන් ය.

(18) 'ප්‍රීති නිවාසය' 'නංගී ගෙදර' යන ස්ථාන පිහිටුවීමට මුල් වුයේ,
(i) තෙරේසා මව්තුමියයි. (ii) ෆ්ලෝරන්ස් නයිටිංගේල් තුමියයි.
(iii) ඉව්ලින් කානි තුමියයි. (iv) ඒඩා ප්‍රනාන්දු සොයුරියයි.

(19) තමා ජීවත් වූ නිවස ජනතා සේවය උදෙසා කැප කළ දේව දාසයා වන්නේ,
(i) මයිකල් රුදිගු පියතුමා ය. (ii) ඩොනල්ඩ් කනගරත්නම් පියතුමා ය.
(iii) මාටින් ලූතර් තුමා ය. (iv) අසීසියේ ප්‍රැන්සිස් තුමා ය.

(20) ''දරුවා බාල වියේදීම යහ මග යවන්න'', මෙම බයිබල් පාඨය සඳහන් වන්නේ,
(i) ජෝබ් පොතේ ය. (ii) මතෙව් පොතේ ය.
(iii) ගීතාවලිය පොතේ ය. (iv) හිතෝපදේශ පොතේ ය.

( ලකුණු 2 x 20 = 40 )

## II කොටස

V පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) කෙටි පිළිතුරු සපයන්න.

(i) ශුද්ධාත්ම ඵල දෙකක් නම් කරන්න.

(ii) ජුදා සමාජයේ කොන් කරන ලද ජන කණ්ඩායම් දෙකක් ලියන්න.

(iii) තිබේරියස් මුහුද හඳුන්වන වෙනත් නමක් ලියන්න.

(iv) ''ගැළවීම අද මේ ගෙදරට පැමිණ ඇත''. මෙය කා විසින් කා හට කියන ලද්දක් ද?

(v) ජේසුස් වහන්සේ ප්‍රේම කළ ගෝලයා ලෙස හඳුන්වන්නේ කවුරුන් ද?

(vi) ශ්‍රාවකයින් තෝරා ගැනීමට පෙර ජේසුතුමා කළ විශේෂ කාර්ය කුමක් ද?

(vii) ධර්ම දූත සේවයට පිටත් කර හැරීමේදී ශ්‍රාවකයින්ට ජේසුතුමා දුන් උපදෙස් දෙක ලියන්න.

(viii) ජේසුස් වහන්සේගේ සේවයේ අරමුණු දෙකක් ලියා දක්වන්න.

( ලකුණු 2 x 8 = 16)

(2) (i) ජේසුතුමාගේ ශ්‍රාවක කණ්ඩායමේ නායකයා කවුරුන් ද?

(ii) ඔහුගෙන් ජේසුතුමා එකවරම තෙවරක් ඇසූ ප්‍රශ්නය කුමක් ද?

(iii) එම අවස්ථාවේ ජේසුතුමා ඔහුට පැවරූ වගකීම් තුන ලියා දක්වන්න. ( ලකුණු 2+3+6 = 11 )

(3) (i) ධර්මදූත සේවය යනු කුමක්දැයි කෙටියෙන් ලියන්න.

(ii) ජේසුස් වහන්සේ වෙතින් ශ්‍රාවකයන් ලැබූ විශේෂ බලයන් තුන නම් කරන්න.

(iii) පාසලේදී ධර්මදූතයෙකු ලෙස ඔබට සේවය කල හැකි අවස්ථා තුනක් ලියන්න. ( ලකුණු 2+3+6 = 11 )

(4) (i) ශුද්ධාත්ම දීමනා සඳහන්ව ඇත්තේ බයිබලයේ කුමන පොතේ ද?

(ii) එහි සඳහන් දීමනාවලින් තුනක් ලියා දක්වන්න.

(iii) ඔබට ඇති ශුද්ධාත්ම දීමනා අන් අයගේ යහපත සදහා යොදා ගන්නා අයුරු කරුණු තුනකින් ලියන්න.

( ලකුණු 2+3+6 = 11 )

(5) (i) අපව පාපයෙන් මුදවාගැනීමට මෙලොවට වැඩියේ කවුරුන් ද?

(ii) ජේසුතුමා පව්කරුවා නොව පාපය ප්‍රතික්ෂේප කරන බව පෙන්වීමට ක්‍රියා කළ අවස්ථා දෙකක් ලියා දක්වන්න.

(iii) ඒවායින් එක් අවස්ථාවක් කෙටියෙන් ලියන්න. ( ලකුණු 2+3+6 = 11 )

(6) (i) සමාජ තහංචි නොතකා ජේසුතුමා කැඳවා ගත් කාන්තාවන් දෙදෙනා නම් කරන්න.

(ii) එම සහෝදරියන් දෙදෙනා ජේසුතුමා ඉදිරියේ හැසිරුණු අයුරු වෙන වෙනම ලියන්න.

(iii) ඔබේ නිවසට පැමිණෙන ආගන්තුකයෙකුට කිතුනුවකු ලෙස ඔබ සලකන ආකාර තුනක් ලියන්න.

( ලකුණු 2+3+6 = 11 )

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2017
## Second Term Test - Grade 8 - 2017

නම : ...............................................   ක්‍රිස්තු ධර්මය පිළිතුරු පත්‍රය   කාලය : පැය 02 යි.

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 1 | (6) | 3 | (11) | 2 | (16) | 1 |
| (2) | 2 | (7) | 1 | (12) | 4 | (17) | 3 |
| (3) | 2 | (8) | 2 | (13) | 1 | (18) | 3 |
| (4) | 4 | (9) | 4 | (14) | 3 | (19) | 2 |
| (5) | 3 | (10) | 3 | (15) | 3 | (20) | 4 |

( 2 x 20 = 40 )

## II කොටස

(1) (i) ප්‍රේමය   ප්‍රීතිය සාමය ඉවසීම
( ශුද්ධාත්ම ඵල නවයෙන් 2 තිබීම සෑහේ)
(ii) සමාරියයන්, බදු අය කරන්නන් ආදි අය
(iii) ගලීල මුහුද හෝ ගෙනසරෙත් විල
(iv) ජේසුස් වහන්සේ විසින් සාකෙවුස්ට
(v) ජොහාන්
(vi) මුළු රැයක් පුරා යාච්ඤා කිරිම
(vii) ගමන් මල්ලක්වත්, කමිස දෙකක්වත්, සැරයැටියක්වත් රැගෙන නොයන්න
(viii) දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරිම, වහලුන්ට මිදීම ලබා දීම ( අරමුණු 5න් 2ක් තිබීම ප්‍රමාණවත්ය)
( 2 x 8 = 16 )

(2) (i) පේදුරු
(ii) ඔබ මට ප්‍රේම කරන්නෙහිද?
(iii) මාගේ බැටළුවන් පෝෂණය කරන්න.
මාගේ බැටළුවන්ගේ එඬේරා වන්න.
මාගේ බැටළුවන් පෝෂණය කරන්න.
( 2 + 3 + 6 = 11)

(3) (i) ජේසුස් වහන්සේගේ සුභාරංචිය ජනතාව වෙත ගෙන යෑමයි.
(ii) රෝගීන් සුව කිරීම, යක්ෂාත්ම දුරු කිරීම, මළවුන් නැගිටවනු ලැබීම.
(iii) කොන්කරන ලද යහළුවන් පිළිගැනීම.
ජාති ආගම් භේද නොසලකා සැමට එක ලෙස සේවය කිරිම.
තමන්ට වැරදි කරන අයට සමාව දීම ආදි පිළිතුරු
( 2 + 3 + 6 = 11)

(4) (i) 1 කොරෙන්ති පොතේ
(ii) ආත්මයානන් තුළ විශ්වාසය ,හාස්කම් කිරීමේ බලය , සුව කිරීමේ බලය ආදි දීමනා වලින් දෙකක්
( 10 වන පාඩම )
(iii) ලියා ඇති පිළිතුරු වලට අනුව ලකුණු ලබාදෙන්න
( 2 + 3 + 6 = 11)

(5) (i) ජේසුස් වහන්සේ
(ii) සාකෙවුස්ගේ නිවසට යාම, පව්කාර ස්ත්‍රියට ගල් ගැසීම,
(iii) ඉහත සිදුවීම් 2න් එකක් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
( 2 + 3 + 6 = 11)

(6) (i) මාර්තා සහ මරියා
(ii) මාර්තා - ජේසුස් වහන්සේට ආගන්තුක සත්කාර කිරීමට වෙහෙසීම
මරියා - ජේසුස් වහන්සේ පාමුල හිඳ කතාන්දර ඇසීම.( සවන්දීම)
(iii) ශිෂ්‍යයා ලියා ඇති පිළිතුර අනුව ලකුණු ලබා දෙන්න. ( 2 + 3 + 6 = 11)